රුහුණ විශ්වවිද්‍යාලය

**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය**

**2020/2021 අධ්‍යයන වර්ෂය - ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය**

**පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2021 නොවැම්බර්**

**MAE 5101 - සාර්ව ආර්ථික න්‍යාය**

එක් කොටසකින් ප්‍රශ්න (02) දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත. කාලය : පැය තුනයි (03).

---

## පළමු කොටස

1. එක්තරා කල්පිත විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන් කිහිපයක වටිනාකම් පහත පරිදි ඇස්තමේන්තු වී ඇතැයි සිතන්න. ඒවා උපයෝගී කොටගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (Y = ආදායම සහ i = පොළී අනුපාතිකය වන අතර සියළු ස්වායත්ත සංඛ්‍යා රු. බිලියන වලිනි).

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම් | $C = 50 + 0.9(Yd)$ |
| පෞද්ගලික ආයෝජන වියදම් | $I = 150 - 5i$ |
| රජයේ බදු අයභාරය | $T = 100$ |
| රජයේ වියදම් | $G = 100$ |
| මුදල් ඉල්ලුම | $L = 0.2Y - 10i$ |
| මුදල් සැපයුම | $Ms = 100$ |
| අපනයන | $X = 20$ |
| ආනයන | $M = 10 + 0.1Y$ |

i. ආර්ථිකයේ IS සහ LM ශ්‍රිත ගණනය කරන්න.

(ලකුණු 05)

ii. ආර්ථිකයේ සාර්ව-සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න

(ලකුණු 03)

iii. ඉහත සමීකරණ මඟින් විස්තර වන්නේ ශ්‍රී ලංකා ආර්ථිකය යැයි උපකල්පනය කරන්න. වර්තමානයේ අධ්‍යාපනික ක්ෂේත්‍රයේ පවතින ගුරුවැටුප් විෂමතාව සමනය කිරීමෙහි ලා රජය රුපියල් දශ ලක්ෂ 30 ක අමතර මුදලක් වැය කිරීමට 2022 රාජ්‍ය අයවැයෙහි යෝජනා කොට ඇත. (අයවැය 2021 නොවැම්බර්). අනෙකුත් දේ ස්ථාවර තත්ත්වයක් තුළ මෙම යෝජිත ෆිස්කල් ප්‍රතිපත්තියෙහි කෙටිකාලීන ආදායම් සහ පොළී අනුපාත ප්‍රතිවිපාක ගණනය කිරීම් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

iv. ආර්ථිකය ආරම්භක තත්ත්වයේ ම පවතීයැයි ද මෙරට මධ්‍යම බැංකුව පොළී අනුපාතිකය 6% ලෙස තීරණය කරනු ලැබුයේ යැයිද සිතන්න. මෙම තීරක පොළී අනුපාතිකය සමතුලිත එකක් බවට පත් කිරීමට මෙරට මධ්‍යම බැංකුව අනුගමනය කළ යුතු විකල්ප මූල්‍ය ප්‍රතිපත්ති සාකච්ඡා කරන්න

(ලකුණු 03)

2.

i. "ආයෝජනයේ පොළී සංවේදිතාව වැඩි වත්ම රජයේ වියදම ඉහළ යාමක තෙරපුම් ප්‍රතිවිපාකයේ තරමද වැඩි වේ" ය යන න්‍යායාත්මක තර්කනය ISLM ආකෘතියේ ප්‍රස්තාරික නිරූපනය යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. පහත සපයා ඇති උපුටනයෙන් විස්තර වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 අග භාගය තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රතිපත්තියේ එක් දිශානතියකි. එම ප්‍රතිපත්තියෙහි කෙටිකාලීන ආර්ථික ප්‍රතිවිපාක සහ අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට කළ යුතු වෙනත් ගැලපීම් උචිත රූප සටහන් යොදාගනිමින් සාකච්ඡා කරන්න. (සංඛ්‍යා යෙදීම අවශ්‍ය නොවේ).
"වර්ෂ 2021 නොවැම්බර් 16 වැනි දින පැවති වෙන්දේසියේ දී රුපියල් මිලියන 53,000 ක් වටිනාකම ඇති භාණ්ඩාගාර බිල්පත් රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මධ්‍යම බැංකුව විසින් විකුණන ලදී." ( Press Release, 19 November, 2021, CBSL)

(ලකුණු 07)

3. පහත සඳහන් ඒවායින් ඕනෑම **දෙකක් (2)** පිළිබඳව විග්‍රහාත්මක සටහන් ලියන්න.

i. සේවා නියුක්තිය හා ආදායම තීරණයවීම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය

ii. නූතන සමස්ත ඉල්ලුම් (AD) වක්‍රයේ බෑවුම හා සම්බන්ධ මූර්ත ශේෂ ප්‍රතිවිපාකය සහ මුදල් ශේෂ ප්‍රතිවිපාකය

iii. මුන්ඩෙල්-ෆ්ලෙමින් ආකෘතිය

iv. රිකාඩෝගේ සාපේක්ෂ පිරිවැය වාසි න්‍යාය

(එක් කොටසකට ලකුණු 08 බැගින් උපරිම ලකුණු 15 යි)

## <u>දෙවන කොටස</u>

04.

I. යම් ආර්ථිකයක සාර්ව ආර්ථික අරමුණු අතර ගැටීම පහත සඳහන් අවස්ථා යටතේ විග්‍රහ කරන්න.

අ. ආර්ථික වර්ධනය හා ගෙවුම් ශේෂය

ආ. ආර්ථික වර්ධනය හා සාධාරණ ආදායම් ව්‍යාප්තිය.

ඉ. ආර්ථික වර්ධනය හා මිල ස්ථායීතාව.

(ලකුණු 06)

II. "කොවිඩ් - 19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකා ආර්ථිකයේ තොග විචල්‍ය (Stock Variables) සහ ප්‍රවාහ විචල්‍ය (Flow Variables) මත බලපෑම් කර ඇත."
ඉහත ප්‍රකාශය මත පදනම්ව උදාහරණ සහිතව ශ්‍රී ලංකා ආර්ථිකයේ තොග හා ප්‍රවාහ විචල්‍ය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 03)

III. හුවමාරු ආර්ථිකයක පවතින ප්‍රධාන ප්‍රතිලාභ තුනක් කෙටියෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 03)

IV. "යම් රටක මිල මට්ටම පහත හෙළමින් ආර්ථිකයේ නිමවුම ඉහළ නැංවීම සඳහා සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියට (Supply – Side Policy) කළ හැකි කාර්යභාරය අතිමහත් ය."
සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය අර්ථ දක්වා යෝග්‍ය රූපසටහනක් ඇසුරින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 03)

05.

I. ඔබ සතුව පවතින මුදල් ප්‍රතිලාභ අත්කරගත හැකි ආයෝජන මාර්ගවල යෙදවීමට අවස්ථාව තිබියදීත් තවදුරටත් මුදල් ලෙස රඳවා තබා ගන්නේ ඇයි ද යන්න කේනීසියානු ද්‍රවශීලතාවරණ න්‍යාය (Keynes's Liquidity Preference Theory) ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 03)

II. යම් කල්පිත ආර්ථිකයකට අදාළ මූල්‍ය දත්ත කිහිපයක් පහත වගුවේ ඇතුළත් කර ඇත. (සංඛ්‍යා දත්ත රුපියල් මිලියන වලිනි)

| අයිතමය | වටිනාකම (2020 අවසානයට) |
|---|---|
| සමස්ත ව්‍යවහාර මුදල් | 830.00 |
| මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 640.00 |
| මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු | 250.00 |
| මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු | 30.00 |
| වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 530.00 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 8500.00 |
| අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ($TSD_{NRFC}$) | 1000.00 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයින්ගේ තැන්පතු ($RD_{FCBU}$) | 400.00 |

අ. ඉහත කල්පිත ආර්ථිකයට අදාළ පහත සඳහන් දෑ ගණනය කරන්න.

- සංචිත මුදල් වටිනාකම
- වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් වටිනාකම
- මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වටිනාකම

(ලකුණු 03)

ආ. 2020 වර්ෂයට අදාළ පටු මුදල් සැපයුම ($M_1$) සහ ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) ගණනය කරන්න.

(ලකුණු 02)

ඉ. සපයා ඇති දත්ත ආශ්‍රයෙන් 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ පුළුල් මුදල් ගුණකය ඇස්තමේන්තු කරන්න.

(ලකුණු 01)

ඊ. ඉහත ආර්ථිකයේ ඉතා පුළුල් මුදල් සැපයුම ($M_4$) ගණනය කිරීම සඳහා ඔබට පැවරී ඇති අවස්ථාවක ඒ සඳහා ඔබ විසින් මූල්‍ය බලධාරීන්ට සපයනු ලබන අතිරේක දත්ත මොනවා ද?

(ලකුණු 02)

III. යම් ආර්ථිකයක පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය (Cost – Push Inflation ) සඳහා දායක වන සාධක හඳුනා ගන්න.

(ලකුණු 04)

06.

I. කේන්සියානු විග්‍රහය අදාළ කර ගනිමින් පිලිප්ස් වක්‍රය (Phillips Curve) ගොඩනාගා ගන්නා ආකාරය යෝග්‍ය රූපසටහනක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 04)

II. අනාගත උද්ධමන අනුපාතිකයේ අපේක්ෂා කෙටිකාලීන පිලිප්ස් වක්‍රය විතැන්වීම සඳහා බලපාන ආකාරය ෆ්‍රීඩ්මාන්ගේ අනුවර්තීය අපේක්ෂණ න්‍යාය (Theory of Adaptive Expectations) ඇසුරින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 04)

III. ආර්ථික වෘද්ධි ආකෘතියක් ලෙස හැරඩ් - ඩෝමර් ආකෘතියේ (Harrod – Dormer Growth Model) මූලිකාංග ගෙනහැර දක්වන්න.

(ලකුණු 04)

IV. ශ්‍රී ලංකාව වැනි සංවර්ධන වෙමින් පවතින රටවල ඉදිරි ආර්ථික වෘද්ධි අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමට හැරඩ් - ඩෝමර් ආකෘතිය මගින් ලබා ගත හැකි පිටිවහල අගයන්න.

(ලකුණු 03)

@@@@@@@@@@@@@@